රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/03/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.06.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර නමුත් මෙතෙක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොකළ නිලධාරීන්ට වැටුප් වර්ධක ගෙවීම.</u>**

අංක 1774/31 දරණ 2012.09.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 හා 2012 පෙබරවාරි මස 14 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කළ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවෙහි 14වන ඡේදය ප්‍රකාරව රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය මත විවිධ තනතුරු නාම යටතේ 2011.08.01 දිනට පෙර රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබ MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

02. ඒ අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති බොහෝමයක් නිලධාරීන් දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා බඳවාගෙන ඇත්තේ 2005 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂයන්වලදීය. මෙම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වසර 10ක සේවා කාලය සම්පූර්ණ වන දිනට (අනෙකුත් සුදුසුකම් සපුරා තිබේ නම්) එනම් 2015 වර්ෂය වන විට සංවර්ධන නිලධාරී සේවයේ II වන ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබයි. නමුත් මෙම නිලධාරීන් අතුරින් සැලකිය යුතු පිරිසක් තවමත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ලේඛන නිසි පරිදි ඉදිරිපත් නොකිරීම මත සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම නොහැකිව ඇති බැවින් ඔවුන්හට සංවර්ධන නිලධාරී සේවයේ ශ්‍රේණිගත උසස්වීම් ලබාදීමට ද හැකියාවක් නොමැත.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව, MN4-2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා උපරිම වැටුප් පියවර වන රු.37,720/- න් ඔබ්බට වැටුප් වර්ධක ලබාදීමේ හැකියාව සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST 5/5/15(4) හා 2023.03.23 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් අනුව උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීමට අදාලව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධාන මගින් ආවරණය කරනු ලබන්නේ කිසියම් නිලධරයකුගේ පාලනයෙන් බැහැර කරුණක් මත සිදුවන තත්වයක් සඳහා බවත්, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළ කළ ද අන්තර්ග්‍රහණය වීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීම මගහැරීම මත එම නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීමට නොහැකි වීම එම නිලධාරීන්ට පාලනය කරගත හැකි කරුණක් බැවින් මෙවැනි නිලධාරීන්හට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි MN 04-2016 වැටුප් පරිමාණයේ උසස්වීම් නොලද තීරුව යටතේ රු.37,720/-න් ඔබ්බට වැටුප් වර්ධක ලබා දීමේ හැකියාවක් නොපවතින බව දන්වා ඇත.

04. ඒ අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළකර, තවමත් අන්තර්ග්‍රහණය වී නොමැති දැනට ආශ්‍රිත සේවා ගණය යටතේ III ශ්‍රේණියේ තනතුරක සේවය කරන නිලධාරීන්ට රු.37,720/- ඔබ්බට වැටුප් වර්ධක ලබාදීමට හැකියාවක් නොපවතින බව කාරුණිකව ඔබ වෙත දන්වමි.

05. එමනිසා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලදුව නිසි පරිදි ලේඛන ඉදිරිපත් නොවීම මත මෙතෙක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන බවට ලිපියක් නිකුත් වී නොමැති නිලධාරීන්ට වැටුප් වර්ධක ගෙවීමේදී ඉදිරියේදී ගැටළුකාරී තත්වයක් මතුවන බැවින්, සංවර්ධන නිලධාරීන් සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කල නිලධාරීන්ගේ ආයතනික කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් වන මගේ අංක CS/DOS/Policy/03/05/(II) හා 2021.12.16, 2022.06.15 සහ 2023.01.05 දිනැති ලිපි කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන අතර ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවයේ නිරතව සිටින සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලදුව මෙතෙක් අන්තර්ග්‍රහණ ලිපිය ලැබී නොමැති නිලධාරීන් කඩිනමින් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ලිපිලේඛන මා වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

06. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය ලිපි ලේඛනවල අඩුපාඩු සෑම සතියකම සඳුදා දින මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරනු ලබන බව මගේ අංක CS/DOS/Policy/පොදු/01 හා 2021.09.17 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර මේ වන විට නිලධාරීන් 1350කගේ පමණ ලේඛන අඩුපාඩු වෙබ් අඩවියේ පළ කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ නිලධාරීන් සම්බන්ධයෙන් ලේඛන/ අඩුපාඩු වෙබ් අඩවියේ පළ කර තිබේනම් එම ලේඛන මා වෙත එවීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටිමි.

07. තවද මගේ අංක CS/DOS/Policy/පොදු/01 හා 2021.10.25 දිනැති ලිපිය මගින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කරමින් නිකුත් කරන ලද ලිපිය අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය සඳහා ඉදිරිපත්ව ඇති සහ වසර තුනක කාලයකට වැඩි කාලයක් අක්‍රියව ඇති ලිපිගොනු සම්බන්ධව කටයුතු කිරීම සම්බන්ධ වාර්තාවක් මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ සෑම සති දෙකකට වරක් පළ කරනු ලබන අතර 2023.04.03 දින වන විට අක්‍රිය තත්වයේ ලිපිගොනු 606ක් වෙබ් අඩවියේ පළ කර ඇති බැවින් එහි ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ නිලධාරීන්ගේ ලිපිගොනු ද අක්‍රිය තත්වයේ පවතින ලිපිගොනුවක් ලෙස හඳුනාගෙන ප්‍රකාශයට පත්කර තිබේනම් එහි දක්වා ඇති ලේඛන/ තොරතුරු ද සමඟින් අදාල නිලධාරීන් සක්‍රිය සේවයේ යෙදෙන බවට නොපමාව මා දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්